- **ආදරණීය දුවේ පුතේ,**

අප්‍රාණවාචී ඒකවචන උක්ත පද සමග ක්‍රියා පදයේ භාවිතය - වර්තමාන කාලය

පියවර 1

සරුංගලය ඉහළ අහසේ පාවෙයි.
ගස සුළඟට සෙලවෙයි.
දිය පහර වේගයෙන් පහළට ගලයි.
කොළය බිමට වැටෙයි.
බෝලය කන්දෙන් පහළට පෙරළෙයි.
මෙම වාක්‍ය ගුරුවරයා කියන්න.
සිසුන් ලවා ද කිහිප වරක් කියවන්න.

පියවර 2

- සරුංගලය ඉහළ අහසේ පාවෙයි. යන වාක්‍යයේ 'සරුංගලය' යනු අප්‍රාණවා ඒකවචන උක්ත පදයක් වේ.
- 'පාවෙයි' යනු ක්‍රියා පදයක් වේ. එය ඒක වචන පදයකි.
- 'සරුංගලය ඉහළ අහසේ පාවෙයි' යන වාක්‍යය අප්‍රාණවාචී ඒකවචන වර්තමාන කාල වාක්‍යයක් වේ.
- බොහෝ විට වර්තමාන කාල ඒකවචන ක්‍රියා පද 'යි' යන අකුරෙන් අවසන් **වේ.**

පියවර 3

මේ ආකාරයට ම,

- ගස සුළඟට සෙලවෙයි.
- දියපහර වේගයෙන් පහළට ගලයි.
- කොළය බිමට වැටෙයි.
- බෝලය කන්දෙන් පහළට පෙරළෙයි.

ඉහත සඳහන් වාක්‍යවල ඉරි ඇඳි නාම පද අප්‍රාණවාචී ඒකවචන උක්ත පද වන අතර, එම වාක්‍යවල ඉරි ඇඳි ක්‍රියා පද ඒකවචන ක්‍රියා පද බවත්, ඒකවචන ක්‍රියා පද 'යි' යන්නෙන් අවසන් වන බවත් කියා දෙන්න.
ඉහත වාක්‍ය සියල්ලේ ම ඉරි ඇඳි නාම පද අප්‍රාණවාචී ඒකවචන උක්ත පද වේ, එහි ඉරි ඇඳි ක්‍රියා පද වර්තමාන කාලයෙන් ඇත.

●● නාම පද ශබ්ද නඟා කියවන්න.
●● ක්‍රියා පද ශබ්ද නඟා කියවන්න.
●● වාක්‍ය සියල්ල ම ශබ්ද නඟා කියවන්න.

**ඔබත් අප්‍රාණවාචී ඒක වචන වර්තමාන කාලයට අයත් වාක්‍ය 05 ක් ලියන්න.**

1)........................................................................................................................................

2)........................................................................................................................................

3)........................................................................................................................................

4)........................................................................................................................................

5)........................................................................................................................................